අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்
THE OFFICE ON MISSING PERSONS

# ඇබෑර්තු

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, 2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත මඟින් ස්ථාපිත කරන ලද කාර්යාලකි.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ පවත්නා පහත සඳහන් තනතුරු සඳහා **වසර 2ක කොන්ත්‍රාත් පදනම** මත (මාස 3 ක පරිවාස කාලයක් ඇතුලත්ව) සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## මූල්‍ය හා ප්‍රසම්පාදන ප්‍රධානී (තනතුරු 01) HM 1-1

## Head of Finance and Procurement

**රැකියාවේ ස්වභාවය** : මූල්‍ය හා ප්‍රසම්පාදන අංශයේ රාජකාරි සහ වගකීම් ඉටු කිරීම, ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ අදාල උපායමාර්ගික විධි සකස් කිරීම හා සංවර්ධනය කිරීම මෙන්ම පද්ධති සහ සියලුම මූල්‍ය හා ප්‍රසම්පාදන ක්‍රියා සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම

**සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මූල්‍ය/ ගිණුම්කරණය/ ව්‍යාපාර අධ්‍යනය/ වාණිජ විද්‍යාව/ කළමනාකරණ (මූල්‍ය) යන ක්ෂේත්‍රවල ප්‍රථම උපාධියක් **හෝ** තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට අදාල වෙනත් උපාධියක් **සමග** අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය **සහ** සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ කීර්තිමත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද.

**වයස** : අවු. 35 ට නොඅඩු විය යුතු අතර අවු. 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු. 80,295 /-

මෙම තනතුරට වාහන දීමනාවක්, ඉන්ධන දීමනාවක් හා වෙනත් අදාල ආයතනික දීමනා හිමිවේ.

**ඉහත සියලුම තනතුරු සඳහා අදාළ වන කරුණු :**

- සෑම අයදුම්කරුවෙක්ම,
  - ✓ ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
  - ✓ යහපත් කායික හා මානසික තත්වයෙන් යුක්ත විය යුතුය
  - ✓ දිවයිනෙහි ඕනෑම ස්ථානයක සේවය කිරීමට හැකිවිය යුතුය
  - ✓ යහපත් චරිතයකින් හෙබි විය යුතුය
- මෙම සියලුම තනතුරු **වසර 2ක කොන්ත්‍රාත්** කාලයක් සඳහා බඳවා ගනු ලැබේ (මාස 3 ක පරිවාස කාලයක් ඇතුලත්ව). මූලික වැටුපට අමතරව අනුමත අනෙකුත් දීමනා හිමිවේ.
- පරිගණක සාක්ෂරතාවය අමතර සුදුසුකමක් වේ.
- අප විසින් සපයා ඇති අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.
- දැනටමත් රාජ්‍ය සේවයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක සේවයේ නියුතු වූවකු නම් අදාල ආයතන හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් බහා එවන කවරයේ **වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර** සඳහන් කළ යුතුය. එසේ තනතුර සඳහන් නොකරන අයදුම්පත් **ප්‍රතික්ෂේප** කරනු ලැබේ.
- අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.
- අයදුම්කරුවන් විසින් එවනු ලබන අයදුම්පත් අතරින් තෝරාගත් අයදුම්කරුවන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී ලබාගන්නා ඉහළ ලකුණු මත තෝරා ගනු ලැබේ.
- අයදුම්පත්, අදාල සහතිකවල පිටපත් සමඟ **2024 දෙසැම්බර් 23** වන දිනට පෙර **විධායක අධ්‍යක්ෂ, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, අංක 40, 03 වන මහල, බුත්ගමුව පාර, රාජගිරිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

**නීතිඥ මහේෂ් කටුලන්ද**
**සභාපති**
**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**